# MANRECAP මාසික පුවත් නිවේදනය #15

| නොවැම්බර් 2006 සිට දෙසැම්බර් 2006 | # 15 |
|---|---|

## 1 : ශාන්තිපුරම් ප්‍රදේශයේ ප්‍රසිද්ධ වෙළඳ පොලක් ආරම්භ කිරීම.



පසුගිය අගෝස්තු මාසයේදී ශාන්ති පුරම් ප්‍රදේශය තුල කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය මගින් විවෘත වෙළඳ පොලක් සඳහා අවශ්‍ය ගොඩනැගිල්ලක් සදා නිමකරන ලදී.

අත්හදා බැලීමේ පදනම මත පසුගිය නොවැම්බර් මාසයේදී මේ ගොඩනැගිල්ල තුල වෙළඳ කටයුතු සඳහා සාප්පු කිහිපයක් විවෘත කරන ලදී. මේ ගොඩනැගිල්ලේ පාලන කටයුතු ප්‍රාදේශීය සභාවට පවරා දීමට කටයුතු කෙරී ගෙන යයි. මේ අතර දැනට ග්‍රාම සංවර්ධන සමිතිය සහ කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය මේ ගොඩනැගිල්ල පාලන කටයුතු සහ වෙළඳ කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම බාරගෙන සිටී.

මේ විවෘත වෙළඳ පොල සහ විවිධ සේවා සමුපකාර සමිතියේ ආයතනයක්ද මේ භූමි භාගය තුලම සදා නිමවා ඇති හෙයින් ශාන්තිපුරම් ප්‍රදේශයේ වෙළඳ පොලට ඇති ගමනා ගමන පහසුතාවය වර්ධනය වී ඇත.

## 2 : පෙර පාසැල් දරුවනට සනීපාරක්ෂාව පිළිබද දැනුවත් කිරීමේ වැඩසටහන



ශාන්ති පුරම් සමය පුරම් හා පුතුක්කමාම් ප්‍රදේශයේ පසුගිය නොවැම්බර් මාසය තුලදී පෙර පාසැල් දරුවන් සඳහා සනීපාරක්ෂාව පිළිබද වැඩ සටහන් තුනක් ම ක්‍රියාත්මක කරන ලදී. මෙය මැන්රිකැප් ව්‍යාපෘතියේ සහයෝගය ඇතිව මහජන සෞඛ්‍ය නිලධාරීන් විසින් පවත්වා ගෙන යන ලදී.

කලින් සදහන් කල ගම්මාන තුනේ ජල ටැංකි සහ වැසිකිලි කිහිපයක්ම පෙර පාසැල් පිහිටි භූමි භාගයන් තුලම අමාත්‍යාංශ අරමුදල් වලින් CBO ව මගින් තනවන ලදී. මේ දැණුවත් කිරීමේ වැඩ මුලු පෙර පාසැල් ගුරුවරුන් උදෙසා ඉලක්ක වු අතර එහිදී ඔවුනට වැසිකිලි නියමාකාරයෙන් පාවිච්චි කරන්නේ කෙසේද යන්න ගැනත් සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබද මුලික දැණුවත් කිරීමේ වැඩ පිළිවෙලක් ද එයින් ළමයින් දැණුවත් කරන ආකාරයද වටහා දෙන ලදී. පසුගිය අගෝස්තු මාසයේදී ශාන්ති පුරම් ප්‍රදේශය තුල කාන්තා ග්‍රාම සංවර්ධන සමිතිය මගින් විවෘත වෙළඳ පොලක් සඳහා අවශ්‍ය ගොඩනැගිල්ලක් සදා නිමකරන ලදී.

## 3 : පැපුවා නිව්ගිනියා නිලධාරීන් මැන්රිකැප් ආයතනයේ නිලධාරී හමුව.

පැපුවා නිව්ගිනියා රාජ්‍ය නිලධාරීන් සිව්දෙනෙකු ලංකාවේ ප්‍රජා පදනම් ක්‍රියාකාරකම් ගැන අවබෝධයක් ලබා ගැනීමට මේ රටට පැමිනියහ. පසුගිය නොවැම්බර් 22 වන දින ඔව්හු මැන්රිකැෆ් නිලධාරීන් සහ අනුරාධපුර ගම්මාන වල ක්ෂ්ඩ නියාමක වරුන්ද හමුවුහ. එදා ඔවුන් හමුවී යලි පදිංචි කරන ප්‍රදේශ වල ඉඩම් ප්‍රශ්න නිරාකරණය කිරීමට අනුගමනය කරන ක්‍රියාවලිය, ප්‍රජා පාලන පුනරුත්ථාපන කටයුතු නිලධාරීන්ගේ ක්‍රියාපටිපාටිය සහ වගකීම් සුලු මුල්‍ය ක්‍රියාවලියන් යනාදිය ගැන අදහස් හුවමාරු කර ගත්හ. දැනට පවතින

ආරක්ෂක හේතූන් නිසා කෙසේ වුනත් ඔවුනට මැන්රිකැෆ් ව්‍යාපෘති වැඩ බිම් වලට යෑමට නොහැකි විය. කෙසේ වුවත් ප්‍රජා මූලික ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඔවුන් ලබා ගත් අත්දැකීම් ඉතාම අගනා බවටත් ඉතාම සතුටුදායක බවටත් ඔවුන්ගේ ඇගයීමට ලක්විය.

## 4 : ප්‍රාදේශීය බැංකු වල පලමු සංවත්සරය



2006 සැප්තැම්බර් මාසය අවසාන වන විට මේ සියලුම ඉලක්ක ගම්මාන වල කාන්තා ඉතිරිකිරීම් කණ්ඩායම් 38 ක්ද මුලු සාමාජික සංඛ්‍යාව 411 ක්ද විය. ඔවුන් විසින් රුපියල් ලක්ෂ තුනක පමණ මුදලක් ඉතිරිකර තිබුණු අතර එයින් එක් ලක්ෂ හතලිස් දාහක මුදලක් හදිසි ණය වශයෙන් කණ්ඩායම් සාමාජිකයිනට ලබාදී තිබුණි. මෙයට අමතරව මන්නාරම් දිසා ලේකම් කොට්ඨාශයේ වඩ්ඩුපිත්තාන්මාඩු ශාඛාව සහ ශාන්තිපුරම් ශාඛාව සහ මාන්නායි උප දිසා ලේකම් කොට්ඨාශයේ පලිආරු ශාඛාව යන තුන ප්‍රාදේශීය ලේකම් බැංකු වශයෙන් ක්‍රියාත්මක විය. 2005 අගෝස්තු මාසයේ සිට ප්‍රදේශයේ කාන්තාවන් ඉතිරිකිරීමේ කාර්යයේ නියැලී සිටි අතර ඔව්හු තම ඉතිරි කිරීමේ බැංකු වල තැන්පත් කලසේම හදිසි අවස්ථාවලදී ඒවායින් ණය මුදල් ද ලබාගෙන තිබේ.

පසුගිය දෙසැම්බර් මස 27 සහ 29 වන දින වලදී කාන්තා ඉතිරිකිරීම් කණ්ඩායම් එක් වී මේ ප්‍රාදේශීය බැංකුවේ සංවත්සර උත්සවයක් සංවිධානය කරන ලදී. ගතවූ කාල සීමාව තුලදී ඔවුන් ලබා ඇති දියුණුවත් ඔවුනොවුන් අතර වර්ධනය වූ සහයෝගයත් සම්බන්ධතාවයන් ගැන ඉහලින් සමරණ ලදී.

මේ ඉතිරි කිරීම් ක්‍රියාවලිය ඉතාම දුෂ්කර තත්වයන් යටතේ දිවි ගෙවන සාමාජිකාවන් හට ඔවුන් අතරේ එක්සත් භාවයකුත් සාමූහික හැගීමකුත් ඇතිකරලීමට සමත්වී ඇති හෙයින් එයම ආරක්ෂක ජාලයක් වශයෙන් ක්‍රියාත්මක වේ.

- කාන්තා ඉතිරිකිරීමේ කණ්ඩායම් ඉතිරිකිරීම් සහ ණය දීමේ ක්‍රියාකාරීත්වයන් තරමක් අත්දැකීම් බහුල කණ්ඩායම් වන විට එවැනි කණ්ඩායම් 10-30 ක් අතර ප්‍රමාණයක් එක් කොට ප්‍රාදේශීය බැංකුවක් පිහිටුවා ගනු ලැබේ මේ ප්‍රාදේශීය බැංකුවට අලුතින් සාමාජිකාවන් බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය තැන්පතු සහ ණය දීම් සඳහා අවශ්‍ය ක්‍රියාකාරී තීරණ ගැනීම කරගෙන යනු ලැබේ.

## 5 : සේවා ගම්මානයේ කෘෂිකර්ම ක්‍රියාකාරීත්වය



ගොවි සංවිධානය විසින් පැල තවාන් ගොවිපලේ කොස් දෙහි කජු දොඩම් යනාදී පැල වර්ග වවනු ලැබේ. කිසියම් කාල සීමාවකට පසු සේවා ගම්මානයේ ගොවීන් අතර අඩු මිලට මේ පැල බෙදා දීමට කටයුතු කරණු ලැබේ.